# කොමිෂන් සභාවේ පණිවිඩය



ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා
සභාපති



එම්.ඒ.පී.සී. පෙරේරා මහතා
සාමාජික



නීතිඥ
අමීර් ෆායිස් මහතා
සාමාජික



නීතිඥ
ඒ. ෂන්මුගනාදන් මෙනවිය
සාමාජික



මහාචාර්ය
ලක්ෂ්මන් දිසානායක මහතා
සාමාජික

පෞර - 2025 කෙටි චිත්‍රපට තරඟාවලිය සහ උලෙළ දෙවන වරටත් සාර්ථකව පැවැත්වීමට හැකිවීම සතුටට කරුණකි.

මැතිවරණ කොමිෂන් සභාවේ සිව් අවුරුදු උපායමාර්ග සැලැස්මේ එක් සුවිශේෂී ක්‍රියාකාරකමක් ලෙස පළමු වැඩසටහනේ සාර්ථකත්වය සහ ගුණාත්මකභාවය එලෙසම පවත්වා ගනිමින් එම කර්තව්‍ය මෙලෙස ඉදිරියට ගෙනයාමට හැකිවීම ප්‍රශංසනීය වේ.

තනි පුද්ගලයෙකුගේ ඡන්දයකට කළ හැකි පරිවර්තනය කෙබඳු ද යන්නත්, ඡන්දයේ බලය පිළිබඳ අදහස සමස්ත ඡන්ද හිමියා වෙත සරල හා ආකර්ශනීය ලෙස ගෙන යාමත් කාලීන අවශ්‍යතාවක් බව මැතිවරණ කොමිෂන් සභාව ලෙස අපි විශ්වාස කරමු.

එකී කාලීන අවශ්‍යතාව මුදුන් පමුණුවා ගැනීමෙහිලා පාසල් ශිෂ්‍ය ප්‍රජාව, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්, කලා ක්ෂේත්‍රයේ ප්‍රාමාණිකයින් සහ තරුණ චිත්‍රපටකරුවන්ගේ නිර්මාණශීලී දායකත්වය තුළ මහජනතාව වෙත යථෝක්ත පණිවුඩය රැගෙනයාම සඳහා චිත්‍රපට සමුච්චයක් නිර්මාණය කර ගැනීම මෙම වැඩසටහනේ අරමුණයි.

එම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා අප සමඟ එක්ව ක්‍රියා කළ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික චිත්‍රපට සංස්ථාව, කැලණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපය සහ රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇතුළු නන් අයුරින් සහාය දුන් සියල්ලන් වෙත මැතිවරණ කොමිෂන් සභාවේ ගෞරවනීය ස්තුතිය පළ කරමු.

# මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාව "සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" බවට තහවුරු කිරීමේ ගමන් මාර්ගයේ දී මැතිවරණ කොමිෂන් සභාව අනුගමනය කරන සිව් අවුරුදු උපායමාර්ග සැලැස්ම තුළ "දැනුම්වත් කිරීම සහ සජීවිකරණය" යනු ප්‍රධාන අවධාරිත ක්ෂේත්‍ර අතරින් පළමුවැන්නයි. ඒ යටතේ දෙවැනිවරටත් පැවැත්වෙන පෞර - 2025 ඡන්දයේ බලය පිළිබඳ කෙටි චිත්‍රපට තරගාවලිය සහ උලෙළ සඳහා සැකසෙන සමරු කලාපයට පණිවුඩයක් නිකුත් කිරීම සතුටට කරුණකි. යම් රාජ්‍යයක් සර්වජන ඡන්ද බලය සැබෑ ලෙසම අරුත් ගැන්වීමට නම්, එහි පුරවැසියන් ඡන්ද බලය, ප්‍රජාතන්ත්‍රවාදය, පරමාධිපත්‍ය හා නිදහස පිළිබඳ සංකල්ප මනා ලෙස වටහා ගෙන සිටීම වැදගත් වන සේම ඡන්ද බලය ඵලදායීව භාවිතා වීමට රුකුලක් වෙයි.

මෙකී සංකල්ප නිසි අයුරින් ජනගත කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විවිධ මාධ්‍ය යොදාගන්නා අතර, කෙටි චිත්‍රපට තරගාවලිය තුළින් මෙම පණිවිඩ ජනගත කිරීම ද එහිම දිගුවකි. වර්තමානයේ පුරවැසියන්ගෙන් වැඩි කොටසක්, විශේෂයෙන්ම තරුණ පරපුර තොරතුරු ලබා ගැනීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස කෙටි වීඩියෝපට පරිශීලනය කරති. එම අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් ඡන්ද බලය පිළිබඳ නිර්මිත මෙම තරඟාවලියේ ජයග්‍රාහී චිත්‍රපට මඟින් හෙට දිනයේ ජන මනස දේශපාලනික වශයෙන් පුළුල් මානයකට රැගෙනයාම අපගේ අපේක්ෂාවයි. එබැවින් මෙම කාර්ය සඳහා මැතිවරණ කොමිෂන් සභාවට සහාය දුන් සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ටත්, මේ සඳහා කැපවූ සියලුම කාර්ය මණ්ඩලයටත්, මාගේ ස්තූතිය සහ ප්‍රසංශාව එක් කරමි.

රසික පීරිස් - මැතිවරණ කොමසාරිස් ජනරාල්

## පෞර කෙටි චිත්‍රපට උලෙළ පිළිබඳව හැඳින්වීමක්

"පෞර" යනු ප්‍රජාතන්ත්‍රවාදයේ මූල බීජය හටගත් ග්‍රීක නගර රාජ්‍ය තුළ පුරවැසියා යන තේරුම දුන් වදනයි. පුරවැසි සහභාගීත්වය මත තීරණවලට එළැඹීම ප්‍රජාතන්ත්‍රවාදයේ හරයයි. පෞර කෙටි චිත්‍රපට උළෙල විදහා පාන්නේ ද සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඡන්දදායකයින්ට කළ හැකි බලපෑමේ බලයයි.

මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලබන පෞර කෙටි චිත්‍රපට උලෙළේ දෙවන දිගහැරුම 2026.05.09 දින කොළඹ තරංගනී සිනමා ශාලාවේ දී පැවැත්වෙන්නේ ඡන්ද බලය පිළිබඳ පුරවැසියන් දැනුම්වත් කරමින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට අවශ්‍ය පසුබිම සැකසීමේ තවත් එක් පියවරක් ලෙසයි. මෙවර මෙම කෙටි චිත්‍රපට උලෙළ සඳහා මාතෘකා කොට ගන්නේ "Stories of Power of Vote" යන්නයි. මෙහිදී මුළු දිවයිනම ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික්කයකම පෞර වැඩසටහන පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා වන වැඩමුළු 25 ක් පවත්වන ලදී. මෙම වැඩමුළුවල දී ප්‍රජාතන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය හා ජනතා පරමාධිපත්‍යය බලය පිළිබඳව දේශනයක්ද කෙටි චිත්‍රපට නිර්මාණකරණය පිළිබඳ දේශනයක්ද ඇතුළත් විය.

විශේෂයෙන් පාසල් සිසුන් ඉලක්ක කර වැඩමුළු සංවිධානය කළ ද ඊට තරුණ කාන්තා හා විවෘත අංශයේ සාමාජිකයන්ද සහභාගි වීම කැපී පෙනුණි. මාධ්‍ය මඟින් සහ මැතිවරණ කොමිෂන් සභාවේ සමාජ මාධ්‍ය ජාලා හා ප්‍රචාරණ විධික්‍රම මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙනු ලැබුයෙමු. එහිදී, ඉහත තේමාවට අදාළව පාසල් හා විවෘත අංශවලට අමතරව කෘත්‍රිම බුද්ධිය භාවිතා කර (AI තාක්ෂණය මඟින්) නිපදවූ කෙටි චිත්‍රපට සඳහා ද තරගාවලියේ අවස්ථාවක් ලබා දෙන ලදී.

මේ අනුව, ඉහළ සහභාගීත්වයක් උක්ත අංශ 03 සඳහාම පැවති අතර, රට තුළ ඇති වූ දිට්වා හදිසි ආපදා අවස්ථාව මත යම් කාල සීමාවක් මෙම සිනමා උලෙළ කල් තැබීමට ද සිදු විය. එකී වාතාවරණය තුළ පවා ඉදිරිපත් වූ චිත්‍රපට සංස්කෘතික අධ්‍යක්ෂතුමිය සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් එක්ව නම් කරන ලද ක්ෂේත්‍රයේ ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක විනිශ්චයට භාජනය කරවන ලදි. මෙවැනි නිර්මාණකරණයක් මඟින් ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සිනමාවට ඇති ඇල්ම බැල්ම ප්‍රජාතන්ත්‍රවාදය සුරකින දේශයක් වෙනුවෙන් "පෞර" නවමු දිගහැරුමේ තේමාවට අනුගත වන පරිදි ජනගත කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ බලාපොරොත්තුවයි.

මේ සඳහා ශිල්පීය දායකත්වය ලබාදුන් කැලණිය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපය, රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යන ආයතනවල පාලන අධිකාරියට හා සම්පත්දායකයින්ට කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාව කර ගනිමු. මෙම කෙටි චිත්‍රපට උලෙළ වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩමුළු සම්බන්ධීකරණය කළ මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සහ සම්පත්දායකත්වය ලබාදුන් මැතිවරණ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ට ද එම වැඩමුළු සංවිධානය කළ සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ඇතුළු කාර්ය මණ්ඩල වෙත ද ස්තුතිය පළ කරමු.

මම චිත්‍රපට උලෙළ හා එයට සමගාමී කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා නිරන්තර උපදෙස් හා මඟපෙන්වීම් ලබාදුන් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා හා සියළුම සාමාජික මහත්ම මහත්මීන්, මැතිවරණ කොමසාරිස් ජනරාල්තුමා, ලේකම්තුමා, සියළුම අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීතුමාත්, මෙම කාර්යයට සහාය දුන් මැතිවරණ කොමිෂන් සභාවේ සියළුම නිලධාරීන්ටත් ප්‍රණාමය හිමිවේ.

සංවිධායක මණ්ඩලය

# පෞර කෙටි චිත්‍රපට උලෙළ සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු හා ඡායාරූප

## කොළඹ



## ගම්පහ



## කළුතර



## මහනුවර



## මාතලේ



## නුවරඑළිය



## ගාල්ල



## මාතර



## හම්බන්තොට



## යාපනය



## කිලිනොච්චි



## මන්නාරම



## වවුනියාව



## මුලතිව්



## මඩකලපුව



## අම්පාර



## ත්‍රිකුණාමලය



## කුරුණෑගල



## පුත්තලම



## අනුරාධපුර



## පොළොන්නරුව



## බදුල්ල



## මොනරාගල



## රත්නපුර



## කෑගල්ල



# අවසන් විනිශ්චය මණ්ඩලය

## ආචාර්ය අජන්ත අතුකෝරළ



පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ලබා ඇති අතර 2002 දී ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයෙන් පරිගණක ජාල රටා හඳුනාගැනීම (Neural Pattern Recognition) පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගෙන ඇත. ඔහු දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ (UCSC) අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි.

ආචාර්ය අතුකෝරළ මහතාගේ පර්යේෂණ විශේෂඥතාව කෘත්‍රිම බුද්ධිය විෂය තුළ පවතින අතර, පරිගණක, ජාල සහ පරිගණක ජාල රටා හඳුනාගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. යන්ත්‍ර ඉගෙනීම, දත්ත විශ්ලේෂණ, පරිගණක ජාල සහ අථත්‍යකරණය පිළිබඳ ප්‍රාමාණික විද්වතෙකි.

## චතුර ජයතිලක



ටෙලිනාට්‍ය, වාර්තා, අධ්‍යාපනික, වෙළඳ දැන්වීම් හා විවිධ වැඩසටහන් අධ්‍යක්ෂවරයෙකු හා නිෂ්පාදකවරයෙකි. රූපවාහිනී වැඩසටහන් කොටස් 6000 වඩා ප්‍රමාණයකට සම්බන්ධව ක්‍රියාකර ඇත. ටෙලිවිශන් නිෂ්පාදන ආයතන ගණනාවක සාමාන්‍යාධිකාරීවරයෙක් හා නිර්මාණ ප්‍රධානී ලෙස දශක ගණනාවක් සේවය කර තිබේ. ප්‍රකට සිනමා හා සාහිත්‍ය විචාරකයෙක් හා ලේඛකයෙකි.

ජනාධිපති සිනමා සම්මාන උලෙළ, රාජ්‍ය රූපවාහිනී සම්මාන උළෙල, OCIC සිනමා සම්මාන උලෙළ හා UNDA රූපවාහිනී සම්මාන උලෙළ ඇතුළු මෙරට ප්‍රමුඛ සිනමා, රූපවාහිනී, සාහිත්‍ය සම්මාන උලෙළ ජූරි සභිකයෙක් ලෙස ක්‍රියාකර තිබේ. රාජ්‍ය සිනමා අනුමණ්ඩලයේ හා ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දරයි.

## විමලනාත් වීරරත්න



රාවය, ඉරුදින සහ සත්හඬ යන පුවත්පත්වල හිටපු ප්‍රධාන කතුවරයාය. Lanka news web, Next tv, යන ආයතනවල ප්‍රවෘත්ති කළමනාකාරීත්වය දැරූ අතර Leader tv සහ සිළුමිණ පුවත්පතෙහි දේශපාලන විශ්ලේෂකයකු ලෙස කටයුතු කරයි.

සාහිත්‍යය සිනමා සහ නාට්‍ය විචාරකයෙකි. සම්මානනීය තිරු ලිපි රචකයෙකි. රාජ්‍ය සාහිත්‍ය, ස්වර්ණ පුස්තක, රජත පුස්තක, රූපවාහිනී සහ සිනමා උලෙළවල විනිශ්චය මණ්ඩල සහ ජූරි සභිකයකු ලෙසද කටයුතු කර ඇත.

## මනුබන්දු විද්‍යාපති



ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියෙක් හා ග්‍රන්ථ කතුවරයෙක් වන අතර, සිනමා කලා විචාරකයෙක් ලෙස ද කටයුතු කර ඇත.

එසේම සිනමා අනු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කරයි. සිනමා හා ටෙලි නාට්‍ය සම්මාන විනිශ්චය මණ්ඩල ජූරි සභිකයෙකි.


## ගුණසිරි සිල්වා



ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදියෙක් හා ග්‍රන්ථ කතුවරයෙක් වන අතර, සිනමා කලා විචාරකයෙක් ලෙස ද කටයුතු කර ඇත.

එසේම ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයේ හා සිනමා අනු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කරයි. සිනමා හා ටෙලි නාට්‍ය සම්මාන විනිශ්චය මණ්ඩල ජූරි සභිකයෙකි.

## ෆාතිමා ශානාස්



ෆාතිමා ශානාස් කොළඹ විශ්වවිද්‍යාලයේ සන්නිවේදන හා නිර්මාණාත්මක කලා අංශයේ සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකි.

ඇය සම්මානනීය කෙටි චිත්‍රපට අධ්‍යක්ෂවරියක් වන අතර ඇයගේ නිර්මාණ සමාජ සාධාරණත්වය, ස්ත්‍රී පුරුෂ භාවය සහ සංස්කෘතික ආඛ්‍යානයන් ගවේෂණය කරයි.

චිත්‍රපට නිෂ්පාදනයට අමතරව, ඇය ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ රැසක පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළ ක්‍රියාකාරී පර්යේෂිකාවක සහ ලේඛිකාවක ද වේ. ඇය ශ්‍රී ලංකාවේ චිත්‍රපට, රූපවාහිනී සහ ගුවන් විදුලි සම්මාන උලෙළවල ජූරි සභිකයෙකු ලෙස ද කටයුතු කරයි.

## චන්න පී. ද සිල්වා



පෞර පළමු කෙටි චිත්‍රපට උලෙළෙහි සංවිධාන හා විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකි. ලේඛකයෙක් හා සඟරා / ග්‍රන්ථ සංස්කාරකවරයෙකු ද වන අතර, මැතිවරණ කොමිෂන් සභාවේ පර්යේෂණ හා සැලසුම් අංශයේ අධ්‍යක්ෂවරයා ද වේ.